අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

47 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025 (2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025 (2026)
General Certificate of Education (Ord.Level) Examination, 2025(2026)

| | | |
|---|---|---|
| සිංහල සාහිත්‍ය රසාස්වාදය | I, II | පැය තුනයි |
| இலக்கிய நயம் சிங்க | I, II | மூன்று மணித்தியாலம் |
| Appreciation of Sinhala Literary Texts | I, II | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි
மேலதிக வாசிப்பு நேரம் – 10 நிமிடங்கள்
Additional Reading Time-10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

විභාග අංකය : ......................................

උපදෙස්:

(i) I හා II පත්‍රය සඳහා පිළිතුරු සපයා සම්පූර්ණ කාලය අවසානයේ දී වෙන වෙන ම භාරදිය යුතු ය.

(ii) I පත්‍රය සඳහා පිළිතුරු මෙම පත්‍රයේ ම ලිවිය යුතු ය.

(iii) II පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට උත්තර ලියන පොත භාවිත කරන්න.

(iv) I පත්‍රය සඳහා ලකුණු 40ක් ද II පත්‍රය සඳහා ලකුණු 60ක් ද හිමි වේ.

**සිංහල සාහිත්‍ය රසාස්වාදය - I පත්‍රය**

(**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න).

1. (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒ ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු**, දී ඇති හිස්තැන්වල පමණක් ලියන්න.

(1) (i) "ඒ දැන් මතු නොවන්නේ වේ ද යටගිය දවසත් තෙල ලෙසම උන්ට ඇති වූ ඇවිටියක් හැරවීම්"

(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

.....................................................................................................................

(ආ) මෙහි උන්ට යනුවෙන් හැඳින්වූයේ කවරෙක් ද?

.....................................................................................................................

(ii)

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුණ මෙන් උතුරෙත් පෙනෙන විට
**සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට**

(අ) මෙම පද්‍යය ඇතුළත් පැදිපෙළේ රචකයාගේ නම ලියන්න.

.....................................................................................................................

(ආ) මෙම කවියට අනුව ´සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට` යන්නෙන් ඉස්මතු කෙරෙන අර්ථය ලියන්න.

.....................................................................................................................

(iii) මිනිස්හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත
නිදොස් කෙනෙකු මෙදියත උපදනේ නැත
වෙසෙස් සිනිඳු **මුවරද** බර **සහස් පත**
කොරොස් නළින් යුතු වෙයි කටු පෙළින් යුත

(අ) මෙහි මුල් කවි පද දෙකෙහි අර්ථය ලියන්න.

.....................................................................

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
මුවරඳ : ................................
සහස්පත : ............................

(iv) "ඔන්න උඹට පොඩි පැටියෙක් හිටියා, ඒ පැටියගේ අම්මා උඹයි. ඌ හිටි හැටියේ උඹව තනි කරලා උඹව අතෑරලා ගියා."

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?

.....................................................................................................................

..........................................................................................................

...........................................................................................................

(ආ) මේ ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ කතුවරයා කවරෙක් ද?

...........................................................................................................

(v) අපේ මොකවත් නාස්ති කළේ නෑ. උඹ නාස්ති උනා මිසක්.

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?

................................................................................................................

(ආ) මේ ප්‍රකාශය කළේ කාහට ද?

................................................................................................................

(ලකුණු 04x5 = 20යි)

2. පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක්** කොටසකට **පමණක්** පිළිතුරු සපයන්න.

එසඳ මනුෂ්‍ය ලෝකය බැලූ ශක්‍රදේවේන්ද්‍රයෝ කුස රජ්ජුරුවන් සත්මසක් මුළුල්ලෙහි දුක්විඳත් ප්‍රභාවතීන් දැක්ක නොහී උකටලී නියාව දැක ඈ ලැබෙන්ට කිසි කාරණයක් කෙරෙමි සිතා මද්‍ර රජ්ජුරුවන්ගෙන් ගිය දූතයන් බඳු කොට "ප්‍රභාවතී තොම කුස රජ්ජුරුවන් හැර ගොස් පියා පලා අවු ය, වහා අවුත් උන් කැඳවාගෙන යවයි සත්රජ්ජුරුකෙනෙකුන්ට වෙන වෙන ම පත් අසුන් ඇතිව දූතයන් යවූහ. ඔවුන් දැක රජ්ජුරුවෝ සතුටුව වෙන වෙන ම සිය සෙනග පිරිවරා සාගල නුවරට අවුත් වටලා ගෙන උනුන් දැක "තොපි කුමක් නිසා අවුද තොපි කුමක් නිසා අවුදැ"යි ඔවුනොවුන් විචාරා ප්‍රභාවතීන් නිසා මද්‍රරජ්ජුරුවන් විසින් කැඳවා යවූ හෙයින් ආම්හ" යනු අසා, "මේතෙම තමාගේ එක දුව අප සත්දෙනාට ම දේල, මුගේ නො කටයුත්තක් බලව, අප වෙහෙසුයේ යයි දණ්ඩාඝාත විෂඝෝර සර්පයන් පරිද්දෙන් කිපී වෙන වෙන ම අපට ප්‍රභාවතීන් හෝ දෙව, යුද්ධ හෝ කරව"යි පත් අසුන් යවූහ .ඒ අසා මද්‍ර රජ්ජුරුවෝ බලවත් භයපත්ව අමාත්‍යයන් කැඳවා කුමක් කරමෝ දැයි විචාළහ . එකල අමාත්‍යයෝ "දේවයන් වහන්ස, මේ රජදරුවෝ සත් දෙන ප්‍රභාවතීන් නිසා ම අවු ය. ඉදින් නුදුනහොත් පවුරු පදනම් වාසල් බිඳගෙන නුවරට වැදගෙන ජීවිතක්ෂයට පමුණුවා රාජ්‍යය හැරගනුම්හයි කියා සේනාව සන්නද්ධ කොට ගෙන යුද්ධාභිමුඛව සිටිනාහ. වදිනාට පළමු කොට ප්‍රභාවතීන් යවම්හ"යි කීවාහුයි.

එබස් අසා රජ්ජුරුවෝ "එක්කෙනෙකුන්ට ප්‍රභාවතී පාවා දිනුමෝ නම් තෙස්සෝ යුද්ධ කරන්නාහ. එහෙයින් එක්කෙනෙකුන්ට දී සන්හිඳ විය නො හැක්ක. මුළු දඹදිව අග්‍රරාජන්ව සිටි කුස රජ්ජුරුවන් හැරපියා ආ ගමනට විපාක දක්වමි. මැ සත් කඩක් කොට කපා රජ දරුවන් සත් දෙනාට දී පියා ගැලවෙම්ව"යි කිවු ය. එලෙස රජ්ජුරුවන් කී බස් රාජාංගණය මුළුල්ලෙහි ප්‍රකාශව ගියේ ය. එපවත් ඇසූ පරිවාර ස්ත්‍රීහු ගොස් ප්‍රභාවතීන්ට කීහ.එබස් අසා ප්‍රභාවතී මරණ භයින් පෙරළී හඬමින් උනස්නෙන් නැඟී ජාම්බෝනද ස්වර්ණයට බඳු වූ රන්වන් පැහැ ඇති රන්කමින් විසිතුරු වස්ත්‍රධාරීව නඟුන් හා පරිවාර ස්ත්‍රීන් විසින් පිරිවරන ලදුව මෑණියන්ගේ ගෙට ගොස් . . .

(i) කුස රජ්ජුරුවන්ගේ උකටලී බව නැති කිරීමට ශක්‍රදේවේන්ද්‍රයා යෙදූ උපාය කුමක් ද?

..................................................................................................................

..................................................................................................................

(ලකුණු 04යි)

(ii) ප්‍රභාවතීය පතා පැමිණි රජදරුවන් මෙල්ල කිරීමට මද්‍ර රජු අමාත්‍යවරුන්ට කළ යෝජනාව කුමක් ද?

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

(ලකුණු 04යි)

(iii) "ජාම්බෝනද ස්වර්ණයට බඳු වූ රන්වන් පැහැ ඇති" යන්නෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

(ලකුණු 06යි)

(iv) සාගල නුවරට පැමිණි සත්රජ්ජුරුවන් දණ්ඩාඝාත විෂඝෝර සර්පයන් පරිද්දෙන් කිපෙන්නට හේතුව කෙටියෙන් දක්වන්න .

..................................................................................................................

..................................................................................................................

..................................................................................................................

(ලකුණු 04යි)

**නැතහොත්**

රිදියෙන් තනලා රත්රන් ඔබලා
කැරලි කෙටූවයි දැකැත්තේ
සුරතට රන්වන් රැලි නංවා ලා
කදිමට දිලිසෙයි දැකැත්තේ
අඩියෙන් අඩියට තාල කියන්නට
සබයෙන් අවසර ලැබගත්තේ
සතරවරම් දෙවියන්ගේ බලයෙන්
ගොයම් කපමු අපි දැකැත්තේ

ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත ඉරිදා පායන ඉර වාගේ
සඳට සඳක් නැත මෙහෙම සඳක් නැත සඳුදා පායන සඳ වාගේ
දියට දියක් නැත මෙහෙම දියක් නැත කැලණි ගඟේ දියවර වාගේ
කෙතට කෙතක් නැත මෙහෙම කෙතක් නැත ගොයම් නෙළන මේ කෙත වාගේ

ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන් දෙවියනේ වෙල බත් බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ

බෝඹු ඉදල දලු ලා දෝ නො ලා දෝ
කෙකටිය මලේ වක යා දෝ නො යා දෝ
කැලණි ගඟේ ඔරු යා දෝ නො යා දෝ
කළුගෙ නගා මෙහි ඒ දෝ නො ඒ දෝ

කන්ද උඩින් එන කිකිළිය ගෝමරියේ
නළල් වටින් එන දාඩිය මුතු කැටියේ
අත පාමුදු පය පාමුදු වයිරොඩියේ
මට පිටුපා ගෙට යනවද සුරතලියේ

**බඩගිනි වෙලා මම ගිය කල පුතුගෙ ගෙට**
**මැනලා වී දෙකක් දුන්නයි මල්ලකට**
**ගන්දෝ නොගන්දෝ කියලා සිතුණි මට**
**මැනල ද පුතේ කිරි දුන්නේ මං නුඹට**

දොඩම් කපාලා ඇඹුල් තනාලා
නාන්ඩ යන හැටි බලන් කලූ
සේලේ ඇඳලා නෙරිය තියාලා
මිදුලේ සක්මන් කරයි කලූ
දහසක් දීලා වළලු තනාලා
දෑතේ අතලා බලයි කලූ
දුනුකේ මල සේ උළු ගෙයි ඇඳ පිට
ඔළිඳ කෙළින සැටි බලන් කලූ

ලත් පමණට මැටි ඉදි කරවා ගෙන
පත් බැඳලා කළගෙඩි තනවා ගෙන
අත් නැර ම කළගෙඩි තෝරා ගෙන
සිත් සතොසින් කළ පිඹින්ට වෙන වෙන

යසසින් වැඩි පත්තිනි කඳ තෙදිනේ
නුවරට ළඟ පස් නිරිඳුගෙ උයනේ
වට කොට දස දහසක් පිරිවරිනේ
අකලට අඹයක් පල ගති උයනේ

i. කෘෂිකර්මාන්තයේ දී ගොවියා මුහුණ දෙන දුෂ්කරතා ඇතුළත් කවිය උපුටා දක්වන්න.

........................................................................................................................

........................................................................................................................

(ලකුණු 04යි)

ii ඉහත සඳහන් පැදි පෙළෙහි කළු අකුරින් මුද්‍රිත පදායේ අර්ථය ලියා දක්වන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

(ලකුණු 04යි)

iii ජන කවියා උපයෝගී කරගත් භාෂාව පැදි පෙළෙහි සාර්ථකත්වයට හේතු වී ඇති අයුරු පැහැදිලි කරන්න.

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

(ලකුණු 06යි)

iv. "දොඩම් කපාලා ඇඹුල් තනාලා" යන කවියෙහි සඳහන් කාන්තාව වර්ණනා කර ඇති ආකාරය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

........................................................................................................................

........................................................................................................................

(ලකුණු 04යි)

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

47 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024 (2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024 (2025)
General Certificate of Education (Ord.Level) Examination, 2024(2025)

සිංහල සාහිත්‍ය රසාස්වාදය I, II
இலக்கிய நயம் சிங்களம் I, II
Appreciation of Sinhala Literary Texts I, II

**සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය**

- පළමුවන ප්‍රශ්නය ද, 2, 3, 4, 5 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

01 පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් කරන්න.

උ ප න් නෙත් මැරෙන්නෙත් තනියමයි ලොවේ
එ යි න් පිටත්තර වෙන විදියකින් නොවේ
එ යි න් එහෙම නම් තම යුතුකම හමුවේ
බි යෙ න් තැති ගැනුම අපහට තරම් නොවේ

නම් බුව කැමති අය ඇති නම් නො වී මුළා
ග ම් මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලො ම් සිදුරක තරම්වත් අඩ දබර නොලා
පි ම් මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උ ප න් ගමේ බල උරුමය රැක ගන්ට
ස ට න් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉ ති න් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

ව දි න් නේ නැතිව ලොකු නිලධාරින් ට
ත ම න් ගේ බලය උරුමය රැක ගන් ට
හි ති න් වත් කැමති නම් එය කර ගන් ට
ඉ ති න් අඩ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අ ත ත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා
ක ත ත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අ යු ත් තකට අත් දෙක ඔසවන්ට එපා

අ පේ රට අපේ ජාතිය අපේ ගම
අ පේ අසල්වැසියා යන සියල් ලම
අ පේ අතට අවනත කර ගෙන වහම
අ පේ නමට සලකත දිවි දෙමු මෙහෙම

| | |
|---|---|
| මුල බැස තිබෙන ගම්මුන්ගේ සමඟි | සැපා |
| සොලොවා මරා වළලන්නට යොදා | උපා |
| කුල මල උගුල් අටවන බොරු බණක් | පපා |
| නිලධාරින්ට විස්වාසය දෙන්ට | එපා |

(අ) මේ පැදිපෙළෙන් ඉදිරිපත් කෙරෙන මුඛ්‍යාර්ථය

(ආ) එම මුඛ්‍යාර්ථය ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් අවස්ථා

(ඉ) භාෂා භාවිතය

(ඊ) සමාජ අවශ්‍යතා කුළු ගැන්වෙන අවස්ථා

(උ) කාව්‍ය ආකෘති භාවිතය

(ලකුණු 06x5 = 30යි)

02. "වැලපීම" කෙටිකතාවෙන් නිරූපණය කෙරෙනුයේ තම පුතුගේ වියෝවෙන් කම්පාවට පත් පියෙකුගේ ශෝකාලාපයයි. නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

03. තුංමංහංදිය නවකතාවේ සාර්ථකත්වයට උපයුක්ත චරිත නිරූපණය හේතු සාධක වී ඇති ආකාරය සිරිසේනගේ චරිතය ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15යි)

04. "සරල සිදුවීමක් ඇසුරෙන් පාඨක මනසෙහි සෞන්දර්යාත්මක හැඟීම් දැනවෙන පරිදි වාක් චිත්‍රයක් මැවීමට `අලුත ගෙනා මනාලිය` කවිපෙළේ රචකයා සමත් වී ඇත."උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.

(ලකුණු 15යි)

05. "අවස්ථා නිරූපණයේ දී කතුවරයා දක්වන කුසලතාව සද්ධර්මරත්නාවලියේ සාර්ථකත්වයට හේතු වී ඇත." නිර්දිෂ්ට කථා වස්තුව ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025 (2026)

**සිංහල සාහිත්‍ය රසාස්වාදය**

**I පත්‍රය - පිළිතුරු**

01. (i) (අ) බුදුරජාණන් වහන්සේ

(ආ) නන්ද තෙරුන් වහන්සේ

(ii) (අ) සාගර පලන්සූරිය

(ආ) අනාගතය ගැන නිශ්චිතභාවයක් නොමැති බව

(iii) (අ) මිනිසා තුළ යහපත් ගුණ මෙන්ම අයහපත් ගුණ ද ඇත්තේ ය. දොස් නැති පුද්ගලයකු මෙලොව උපදින්නේ නැත.

(ආ) මුවරඳ - මල් පැණි

සහස්පත - නෙලුම්මල

(iv) (අ) ඉයෝනා පොටපොෆ් / ඉයෝනා

(ආ) ඇන්තන් පවුලොවිච් චෙකොෆ් / ඇන්තන් චෙකොෆ්

(v) (අ) ආච්චි / අබිලිංගේ මව / සිරිසේනගේ ආච්චි

(ආ) අබිලිංට

(ලකුණු 04×5 20යි)

02. (i) ප්‍රභාවතී කුස රජ්ජුරුවන් හැර ගොස් පැමිණ ඇති නිසා වහා අවුත් උන් කැඳවා ගෙන යවයි සත්රජ්ජුරු කෙනෙකුන්ට වෙන වෙන ම පත් අසුන් ඇතිව දූතයන් යැවීම

(ලකුණු 04යි)

(ii) ප්‍රභාවතිය සත් කඩක් කොට කපා රජදරුවන් සත් දෙනාට දී ගැලවීම සුදුසු බව

(ලකුණු 04යි)

(iii) ජම්බු නදියෙහි උපන් රත්තරන්වලට සමාන වූ රන්වන් පැහැයෙන් යුක්ත

(ලකුණු 06යි)

(iv) මද්‍ද රජ්ජුරුවන් තමාගේ එක දුව රජදරුවන් සත්දෙනෙකුට දීමට සිතා ඔවුන් කැඳවීම අකටයුත්තක් ලෙස තීරණය කිරීමත් ඒ වෙනුවෙන් ඔවුන් වෙහෙසට පත් කිරීමත් නිසා.

(ලකුණු 06යි)

**නැතහොත්**

(i) ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන් දෙවියනේ වෙල බත් බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ

(ලකුණු 04යි)

(ii) බඩගිනි වෙලා මා පුතාගේ ගෙට ගිය විට
වී දෙකක් මැනලා මල්ලකට දමා දුන්නේ ය.
එය ගන්නද නොගන්නද කියලා මට සිතුණි.
පුතේ මම නුඹට කිරි දුන්නේ මැනලා ද?

(ලකුණු 04යි)

(iii)

- අනුප්‍රාසවත් භාෂා භාවිතය

ඉරට ඉරක් නැත
සඳට සඳක් නැත
අත පාමුදු පය පාමුදු

- ❖ උපමා භාවිතය

දුනුකේ මල සේ
ඉරිදා පායන ඉර වාගේ
සඳුදා පායන සඳ වාගේ

- ❖ සරල බස් වහර භාවිතය

ලස්සන හිමවතේ
දුප්පත්කම නිසයි
මට පිටුපා ගෙට යනවද
ලත් පමණට

(ලකුණු 06යි)

(iv) දොඩම් කපාලා ඇඹුල් තනා ගෙන නාන්න යන ආකාරයත් සේලේ ඇඳලා නෙරිය තබාලා මිදුලේ සක්මන් කරන ආකාරයත් වටිනාකමින් යුත් වළලු දැතේ දමාගෙන සිටින ආකාරයත් දුනුකේ මලක් වැනි මේ කාන්තාව උළු ගෙයි ඇඳ පිට ඔළිඳ කෙළින ආකාරයත් සිත් ගන්නාසුලු ය.

(ලකුණු 06යි)

**සිංහල සාහිත්‍ය රසාස්වාදය**
**II පත්‍රය - පිළිතුරු**

01.

අ) මෙම පැදිපෙළෙන් ඉදිරිපත් වන මුඛ්‍යාර්ථය

අදීන මිනිසෙකු ලෙස සමාජයේ ජීවත් වීමේ දී කෙනෙකු විසින් තමාගේ සිතුම් පැතුම් හැඩගස්වා ගත යුතු ආකාරය. (උදාහරණ නොතිබුණ ද ලකුණු ප්‍රදානය කරන්න.)

*විස්තරයට ලකුණු 06යි.*

ආ) එම මුඛ්‍යාර්ථය ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් අවස්ථා

වඳින්නේ නැතිව ලොකු නිලධාරීන්ට
තමන්ගේ බලය උරුමය රැක ගන්ට

කතත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අයුක්තකට අත් දෙක ඔසවන්ට එපා

*උදාහරණ 02කට ලකුණු 02යි.*
*විස්තරයට ලකුණු 04යි.*
*(ලකුණු 02+04 = 06)යි.*

ඉ) භාෂා භාවිතය

❖ ආවේගශීලි භාෂා භාවිතය

ඉතින් **යමව්** ගම්මුන්ට ම එක් වෙන්ට
ඉතින් අඬ **ගසව්** තම හිත මිතුරන්ට

❖ සරල බස් වහර

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අ ත ත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා

*උදාහරණ 02කට ලකුණු 02යි.*
*විස්තරයට ලකුණු 04යි.*
*(ලකුණු 02+04 = 06)යි.*

ඊ) සමාජ අවශ්‍යතා කුළු ගැන්වෙන අවස්ථා

ලො ම් සිදුරක තරම්වත් අඬ දබර නොලා
පි ම් මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

අ පේ රට අපේ ජාතිය අපේ ගම
අ පේ අසල්වැසියා යන සියල් ලම

අ පේ අතට අවනත කර ගෙන වහම
අ පේ නමට සලකත දිවි දෙමු මෙහෙම

උ ප න් ගමේ බල උරුමය රැක    ගන්ට
ස ට න් කෙරුම සතුටක් නම් වැසි    යන්ට

*උදාහරණ 03කට ලකුණු 03යි.*
*විස්තරයට ලකුණු 03යි.*
*(ලකුණු 03+03 = 06)යි.*

උ) කාව්‍ය ආකෘති භාවිතය

- ✓ සිවුපද ආකෘතිය භාවිත කිරීම
- ✓ එළිවැට / එළිසමය ආරක්ෂා කිරීම

*උදාහරණ 02කට ලකුණු 02යි.*
*විස්තරයට ලකුණු 04යි.*
*(ලකුණු 02+04 = 06)යි.*

*(ලකුණු 06x5 = 30)*

02.

"මගේ පුතා මේ සුමානේ මැරුණේ"

"අනේ කවුද දන්නේ සමහරු කියන්නේ සන්නිපාත උණෙයි කියලා දවස් තුනක් ඉස්පිරිතාලේ හිටියා..... ඒත් මැරුණා. අපේ කරුමෙ තමයි"

"දැන් ඉතින් කුෂ්මා ඉයෝනිච් ඉවරයි. එයා අපට ජීවත් වෙන්ට ඉඩ හැරලා ගියා."

"ඉයෝනා තුළ ඇත්තේ උසුලා ගත නොහැකි ශෝකයකි. ඔහු කුඩා අශ්වයාට මුළු කතාව ම කියයි."

මෙබඳු කරුණු සහිත නිදසුන් තුනක්වත් උපයෝගි කර ගනිමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

*අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 2 බැගින් ලකුණු 06යි. (02x03 = ලකුණු 06)*
*එම උදාහරණ මැනවින් විස්තර කිරීම සඳහා ලකුණු 06යි.(02x03 = ලකුණු 06)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*සමස්ත ලකුණු (06+06+02+01 = ලකුණු 15)යි.*

03.

සිරිසේනගේ චරිතය විකාශනය වන්නේ කථකයා ලෙසිනි.

- ❖ **තම මාමා අනුකරණය කිරීමට තිබූ කැමැත්ත**
  "මාමේ මාත් ටිකක් කපන්නද"
  "සවස දෙක තුන වන විට කොලු කණ්ඩායම බඳු වත්තට එකතුවෙති. අපි චක්ගුඩු පනිමු. යුද්ධ කරමු."
  "ඇඹුල ගේනවා දකින මට සන්තෝසයක් ඇතිවේ."

- ❖ **චිත්‍ර ඇඳීමේ දක්ෂයකු ලෙස ගුරුවරයාගේ ප්‍රසාදයට ලක්වීම**
  "සිරිසේන පින්සලය අල්ලපු හැටියෙන් ම පේනව මිනිහ මේ වැඩේට දක්ෂ බව."

- **අන් අයට උදවු කිරීමට දක්වන කැමැත්ත**
  "තේ කඩේ පාං පෙට්ටිය තබන බාර් එකේ ගිය වතාවෙත් තීන්ත ගෑවේ මම ය."
  "මම මාර්ෂල්ගේ අත්වැඩ කාරයා මෙන් සේවය කරමි. ඔහුට සායම් දියකර දෙමි."

- **මාමාගේ වියෝවෙන් කම්පා වන ආකාරය**
  "මම මහ හඬින් කෑ ගැසුවෙමි. මා හඬන විට අම්මාත් පුංචි අම්මාත් හඬා වැටුණාහ. කවුදෝ මා එළියට වත්තන් කරගෙන ගියේ ය."

  මෙවැනි නිදසුන් තුනක්වත් උපයෝගි කර ගනිමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

  *අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 2 බැගින් ලකුණු 06යි. (02x03 = ලකුණු 06)*
  *එම උදාහරණ මැනවින් විස්තර කිරීම සඳහා ලකුණු 06යි.(02x03 = ලකුණු 06)*
  *භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
  *ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
  *සමස්ත ලකුණු (06+06+02+01 = ලකුණු 15)යි.*

04. කවි පෙළ මගින් වාක් චිත්‍රයක් මැවීමට රචකයා සමත් වෙයි.

- හිස නමා ගති ඈ
- සිහින් රතැඟිලි පටලවාගති
- දැල් තිර අස්සෙන්
- පෙනෙයි ඈ
- සාලයෙන් කාමරයට
  කාමරයෙන් සාලයට
  යන පා හඬ
- පෙනෙයි ඈ
  ඇසෙයි
  දැනෙයි
  මට ගේ හැමතැන

මෙවැනි නිදසුන් තුනක්වත් උපයෝගී කර ගනිමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබිය යුතු ය.

*අදාළ උදාහරණ සඳහා එක් උදාහරණයකට ලකුණු 2 බැගින් ලකුණු 06යි. (02x03 = ලකුණු 06)*
*එම උදාහරණ මැනවින් විස්තර කිරීම සඳහා ලකුණු 06යි.(02x03 = ලකුණු 06)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*සමස්ත ලකුණු (06+06+02+01 = ලකුණු 15)යි.*

05.

- මේ මඟුල් තුනට වඩා නිවන් මඟුල උතුම් බැවින් ඒ උන්ට පමුණුවා ලමී......................
- බුදුහුත් පාත්‍රය අතින් නොගෙන වෙහෙරට ගෙන ගොසින් නන්ද කුමරුනි මහණ වවුදැ යි වදාළ සේක.
- තෙල රහල් කුමරු අප අතින් වස්තු ඉල්වති.............තුලුන් මහණ කරව"
- සැබෑද නන්දයෙනි, භික්ෂූන්ට මෙබන්දක් කිවුදැ`යි විචාරා වදාරා"...............
- "කුමක්ද නන්දයෙනි, රුවින් වූ කලී මේ දෙවඟනෝ යහපත්තු ද නොහොත් දනවු කලණ බිසවු යහපත්තුදැ`යි විචාළ සේක"

වැනි නිදසුන් තුනක්වත් දක්වමින් සවිස්තරාත්මක පිළිතුරක් ලියා තිබීම අවශ්‍ය ය.

*අදාළ උදාහරණ සඳහා එක උදාහරණයකට ලකුණු 2 බැගින් ලකුණු 06යි. (02x03 = ලකුණු 06)*
*එම උදාහරණ මැනවින් විස්තර කිරීම සඳහා ලකුණු 06යි.(02x03 = ලකුණු 06)*
*භාෂා නිරවද්‍යතාව සඳහා ලකුණු 02යි.*
*ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 01යි.*
*සමස්ත ලකුණු (06+06+02+01 = ලකුණු 15)යි*